# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1787/33 - 2012 දෙසැම්බර් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2012.12.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

LA/1951.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, බදුල්ල, හාලිඇල, ඇල්ල ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රමයේ බදුල්ල උඩවෙල ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 නොවැම්බර් මස 19 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/986.

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්ලේන් ඇල්පින් 80 H ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වේවැස්ස වත්ත ඉහල කොටස ගමේ පිහිටි, වේවැස්ස වත්ත ඉහල කොටස නැමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 40 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස:–

| | | |
|---|---|---|
| *උතුරට* | : | සුසානභූමිය හා ප්‍රවේශ මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | පස්සර - බදුල්ල ප්‍රධාන මාර්ගයේ සිට ග්ලේන් ඇල්පින් වත්තට ප්‍රවේශ මාර්ගය ; |
| *දකුණට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 1. බලංගොඩ වැවිලි සමාගම,
වේවැස්ස වත්ත,
බදුල්ල.

12- 588

1A - G 16977 — 355 (2012/12)

නිසා/නි7/එල්ඒ/1885.

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, 2011.12.06 දිනැති අංක 1735/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ අංක 12-761 යටතේ පළ කරන ලද නිවේදනයෙහි "ඉඩම් කොටස්වල පරවශතා අයිතිය අත්කර ගැනීම" වෙනුවට "ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම" යනුවෙන් සංශෝධනය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 නොවැම්බර් මස 19 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/946.

12 - 589

---

නිසා/නි7/එල්ඒ/1609.

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, 2011.12.06 දිනැති අංක 1735/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ අංක 12-756 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි "ඉඩමේ ප්‍රමාණය පර්චස් 6.5 ක් පමණ" යනුවෙන් සඳහන් වුවත් "එහි ප්‍රමාණය පර්චස් 10ක් " වශයෙන් සංශෝධනය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 නොවැම්බර් මස 19 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/939.

12 - 590

LA/2007.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට කොලොන්න බලංගොඩ ජල සම්පාදන ක්‍රමයේ පනාමුරේ භූගත ජලාශයට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 නොවැම්බර් මස 19 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/985.

*උපලේඛනය*

රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පනාමුරේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පනාමුරේ ගමේ පිහිටි, කෝන්ගහහේන නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 22 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :–

| | | |
|---|---|---|
| *උතුරට* | : | කේ. ඒ. හීන්හාමි මහත්මිය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස (කෝන්හගහේන) ; |
| *නැගෙනහිරට* | : | කේ. ඒ. හීන්හාමි මහත්මිය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස (කෝන්හගහේන) ; |
| *දකුණට* | : | කේ. ඒ. හීන්හාමි මහත්මිය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස (කෝන්හගහේන) ; |
| *බටහිරට* | : | කේ. ඒ. හීන්හාමි මහත්මිය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස (කෝන්හගහේන). |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. කේ. ඒ. හීන්හාමි මහත්මිය,
මහකඩේවත්ත,
පනාමුරේ,
ඇඹිලිපිටිය.

12-591

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.